සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper | I | කාලය / காலம் / Time | පැය 01 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

- **පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

අලෙවිකරණය පිළිබඳ පාඨමාලාවක් හදාරා ඇති ලෙසිඳු, කාබනික පොහොර යොදා වගා කළ පලතුරු කවිඳුගෙන් මිලට ගෙන, පලතුරු බීම නිෂ්පාදනය කර අලෙවිකරණ ව්‍යාපාරයක් ඇරඹුවේ ය. මෙය " ලෙසිඳු සිසිල් පැන්" ලෙස නම් කරන ලදී. මේ සඳහා ඔහු සතුව පැවති රු. 50,000ක මුදල සහ රු. 300,000ක් වටිනා උපකරණ ද යෙදුවේ ය. මිත්‍රයකු වූ යුවිඳුගෙන් රු. 50,000ක ණයක් ද ව්‍යාපාරය වෙනුවෙන් ලබා ගත්තේ ය.

(01) ඉහත සිද්ධියේ සඳහන් "ලෙසිඳු සිසිල් පැන්" ව්‍යාපාරය විසින් සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාවය කුමක් ද?
(1) ආහාර (2) බීම (3) වාසස්ථාන (4) ඇඳුම්

(02) "ලෙසිඳු සිසිල් පැන් ව්‍යාපාරය" සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) අයිතිකරු මුදල් හා උපකරණ යෙදීම, මෙම ව්‍යාපාරයට ඇති අවස්ථාවකි.
(2) මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.
(3) මෙම ව්‍යාපාරයට අඛණ්ඩ පැවැත්මක් ඇත.
(4) මෙම ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ඇත.

(03) බීම නිෂ්පාදනය කරන ව්‍යාපාරයේ උපකරණ අයත්වන නිෂ්පාදන සාධකය කුමක් ද?
(1) භූමිය (2) ශ්‍රමය (3) ප්‍රාග්ධනය (4) ව්‍යවසායකත්වය

(04) "ලෙසිඳු සිසිල් පැන් ව්‍යාපාරය" කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයකට අයත් ද?
(1) ඒක පුද්ගල ව්‍යාපාර (2) සංස්ථාපිත සමාගම්
(3) හවුල් ව්‍යාපාර (4) සමුපකාර ව්‍යාපාරය

(05) ඉහත සඳහන් සිද්ධියට සම්බන්ධ පහත දක්වෙන ප්‍රකාශ අතරින්, නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ලෙසිඳු තොග වෙළෙන්දෙකි.
(2) කවිඳු සිල්ලර වෙළෙන්දෙකි.
(3) යුවිඳු මෙම ව්‍යාපාරයේ හවුල්කරුවෙකි.
(4) ලෙසිඳු අලෙවිකරණ පාඨමාලාවක් හදාරා තිබීම ව්‍යාපාරයට ශක්තියකි.

(06) පහත සඳහන් 'A' තීරුවේ දැක්වෙන්නේ ව්‍යාපාරය කෙරෙහි ඇල්මැති පාර්ශවයන් ය. 'B' තීරුවේ එම පාර්ශවයන්ගෙන් ව්‍යාපාරය අපේක්ෂිත දායකත්වය දැක් වේ. A හා B තීරු ගැලපූ විට නිවරදි පිළිතුර තෝරන්න.

| A | B |
|---|---|
| 1. අයිතිකරුවෝ | P. කලට වේලාවට අමුද්‍රව්‍ය සැපයීම. |
| 2. කළමනාකරුවෝ | Q. ව්‍යාපාර කටයුතු සුපරීක්ෂණය |
| 3. සේවකයෝ | R. නිවැරදි තීරණ ගැනීම. |
| 4. සැපයුම්කරුවෝ | S. ශ්‍රම ඵලදායිතාව වැඩි කිරීම. |

(1) PQRS (2) QRSP (3) RSPQ (4) SPQR

(07) පහත සඳහන් වන්නේ ව්‍යාපාරය කෙරෙහි බලපාන පරිසර සාධකයන් ය. ඒවා අදාළ වන ව්‍යාපාර පරිසරය පිළිවෙලින් දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.

A - අයවැය ප්‍රතිපත්තිය
B - උද්ධමනය හා අවධමනය
C - අණපනත් හා ඒවා ක්‍රියාත්මක කරන ආකාරය
D - අන්තර්ජාල පහසුකම්

(1) ආර්ථික පරිසරය, දේශපාලන පරිසරය, නෛතික පරිසරය, තාක්ෂණික පරිසරය
(2) දේශපාලන පරිසරය, ආර්ථික පරිසරය, නෛතික පරිසරය, තාක්ෂණික පරිසරය
(3) ආර්ථික පරිසරය, දේශපාලන පරිසරය, තාක්ෂණික පරිසරය, නෛතික පරිසරය
(4) දේශපාලන පරිසරය, ආර්ථික පරිසරය, තාක්ෂණික පරිසරය, නෛතික පරිසරය

(08) පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ස්ථාවර තැන්පතුවක පොලිය ලබාගත හැක්කේ තැන්පතුව කල්පිරුණු පසු පමණි.
(2) සාමාන්‍ය රේඛනයේ දී චෙක්පතේ මුහුණත සමාන්තර රේඛා දෙකක් ඇඳීම හා විශේෂ රේඛනයේ දී බැංකුවක නමක් ලිවීම පමණක් ප්‍රමාණවත් වේ.
(3) "ගණුදෙනු කළ නොහැක." යන රේඛනයෙන් අදහස් වන්නේ එම චෙක්පත ගණුදෙනු සඳහා යොදාගත නොහැකි බවයි.
(4) චෙක්පත පිටසන් කිරීම යනු, චෙක්පත පිටුපස අත්සන් කිරීම යි.

(09) චනුමි එශන්යා තම ජංගම ගිණුම පිළියන්දල ලංකා බැංකුවේ පවත්වාගෙන යයි. තරුෂි සංජානා තම ජංගම ගිණුම දෙහිවල මහජන බැංකුවේ පවත්වාගෙන යයි. තරුෂි සංජානාගෙන් ලබාගත් භාණ්ඩ වෙනුවෙන් චනුමි එශන්යා, රු. 50,000ක් වටිනා චෙක්පතක් ලබාදෙයි. එම චෙක්පත දෙහිවල මහජන බැංකුවේ තම ගිණුමේ තරුෂි සංජානා තැන්පත් කරයි. මෙම චෙක්පතට අදාළ අණකරු හා අණලදූ පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) චනුමි එශන්යා - දෙහිවල මහජන බැංකුව
(2) තරුෂි සංජානා - දෙහිවල මහජන බැංකුව
(3) චනුමි එශන්යා - පිළියන්දල ලංකා බැංකුව
(4) තරුෂි සංජානා - පිළියන්දල ලංකා බැංකුව

(10) රක්ෂ්‍ය හිමිකම සම්බන්ධව වැරදි ප්‍රකාශනය තෝරන්න.

(1) ස්වාමිපුරුෂයා හා භාර්යාව අතර එකිනෙකාගේ ජීවිත පිළිබඳ රක්ෂ්‍ය හිමිකමක් ඇත.
(2) දේපළ රක්ෂණයේ දී, එම දේපළ නීත්‍යානුකූල අයිතිකරුවන්ට රක්ෂ්‍ය හිමිකමක් ඇත.
(3) නීත්‍යානුකූල ණය ගනුදෙනුවක දී, ණය දුන් තැනැත්තෙකුට දෙන ලද ණය ප්‍රමාණය දක්වා, ණය ලබාගත් තැනැත්තාගේ ජීවිතය රක්ෂණය කිරීමට හිමිකමක් ඇත.
(4) ඕනෑ ම දරුවෙකුගේ ජීවිතය රක්ෂණය කිරීමට එම දරුවාගේ දෙමව්පියන්ට රක්ෂ්‍ය හිමිකමක් ඇත.

(11) විද්‍යුත්, වාචික සහ ලිඛිත යන මාධ්‍යයන් තුනට ම අයත් සන්නිවේදන ක්‍රමයක් වන්නේ,

(1) දැන්වීම් ය. (2) දුරකථන සංවාද ය. (3) විද්‍යුත් තැපැල ය. (4) ස්කයිප් ය.

(12) ප්‍රවාහන ක්‍රමවල වාසි සහ අවාසි කිහිපයක් පහත දැක් වේ.

A - ගමනාන්තය දක්වා යොදාගත හැකිවීම.

B - ඕනෑම වේලාවක යොදාගත හැකිවීම.

C - මාර්ග තදබදයක් ඇති නොවීම.

D - සාපේක්ෂව මාර්ග අනතුරු සංඛ්‍යාව අඩුවීම.

මහාමාර්ග ප්‍රවාහන ක්‍රමයේ වාසි පමණක් දැක්වෙන ප්‍රකාශය වන්නේ,

(1) A පමණි. (2) A හා B පමණි. (3) A, B හා C පමණි. (4) A, C හා D පමණි.

(13) පහත සඳහන් ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) පාරිභෝගිකයාට එදිනෙදා අවශ්‍ය භාණ්ඩ, අවශ්‍ය ප්‍රමාණයට විකිණීම තොග වෙළඳාමේ ලක්ෂණයකි.

(2) සිල්ලර මිලට සාපේක්ෂව තොග මිල වැඩි ය.

(3) පාසල් සමුපකාරයට භාණ්ඩ මිලට ගැනීම සිල්ලර වෙළඳාමට අයත් ය.

(4) සිල්ලර වෙළඳාම හා තොග වෙළඳාම අතර වෙනස පවතින්නේ ගැනුම්කරුවන්ගේ චේතනාව මත ය.

(14) පාසලක කළමනාකරණයට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක් වේ.

A - පන්ති නායකයන් පත් කිරීම.

B - ගුරුවරුන් විසින් සිසුන්ව ඉගෙනීමට පෙළඹවීම.

C - විනයගරුක සිසුන් බිහි කිරීම.

D - ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලිය නිසි ලෙස ඉටු වී ඇත්දැයි සොයාබැලීම හා එසේ නොවන්නේ නම් පිළියම් යෙදීම.

ඉහත තොරතුරු අදාලවන කළමනාකරණ කාර්යයන් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) සැලසුම්කරණය, සංවිධානය, මෙහෙයවීම, පාලනය කිරීම.

(2) සංවිධානය, මෙහෙයවීම, සැලසුම්කරණය, පාලනය කිරීම.

(3) මෙහෙයවීම, පාලනය කිරීම, සැලසුම්කරණය, සංවිධානය

(4) පාලනය කිරීම, සැලසුම්කරණය, සංවිධානය, මෙහෙයවීම.

(15) පහත 'A' තීරුවෙන් අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් කිහිපයක් ද, 'B' තීරුවෙන් එක් එක් විචල්‍යයන්ට අදාළ අයිතමයන් ද දැක් වේ.

| A | B |
|---|---|
| 1. නිෂ්පාදිතය | M. ගෙවීම් ක්‍රම |
| 2. මිල | N. ප්‍රවාහනය |
| 3. ස්ථානය | O. ප්‍රචාරණය |
| 4. ප්‍රවර්ධනය | P. ඇසුරුම |

A හා B තීරු ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

(1) MNOP (2) NOPM (3) PMNO (4) OPMN

(16) ෂෙරුනි, සමාගමක කොටසක් රු. 10/= බැගින් කොටස් 1000ක් මිලට ගෙන වසරකට පසු, රු. 2000/= ක ලාභාංශ ලබාගැනීමෙන් පසු කොටසක් රු. 15/= බැගින් කොටස් සියල්ල ම විකුණුවා ය. මෙම ගනුදෙනුවෙන් ෂෙරුනි ලැබූ ප්‍රාග්ධන ලාභය වන්නේ,

(1) රු. 1000/= (2) රු. 2000/= (3) රු. 5000/= (4) රු. 7000/=

(17) පහත සඳහන් ගනුදෙනු අතරින් හිමිකම වැඩිවීමට බලපාන ගනුදෙනුව තෝරන්න.

(1) අයිතිකරු ව්‍යාපාරයේ මුදලින් රු. 1000/= ක් පෞද්ගලික ප්‍රයෝජනයට ගෙනයාම.

(2) රු. 20,000/= ක් වැටුප් ගෙවීම.

(3) රු. 15,000/= ක් ගෙවල් කුලී ගෙවීම.

(4) අයිතිකරුගේ පෞද්ගලික මුදලින් ව්‍යාපාරයේ රු. 50,000/= ක බැංකු ණය ගෙවීම.

(18) නෙහාන්ගේ ව්‍යාපාරයේ 2017 ජනවාරි 01 දින ගිණුම්කරණ සමීකරණයේ පැවති අගයයන් පහත දැක් වේ.

| වත්කම් (රු.) | = හිමිකම (රු.) | + | වගකීම් (රු.) |
|---|---|---|---|
| 75,000 | 50,000 | | 25,000 |

2017.01.02 වන දින රු. 20,000කට ලී බඩු මිලට ගැනීමෙන් සහ රු. 5000ක් බැංකු ගිණුමේ තැන්පත් කිරීමෙන් පසු ගිණුම්කරණ සමීකරණයේ අගය වන්නේ,

| | වත්කම් (රු.) | = | හිමිකම (රු.) | + | වගකීම් (රු.) |
|---|---|---|---|---|---|
| (1) | 100,000 | = | 75,000 | + | 25,000 |
| (2) | 100,000 | = | 50,000 | + | 50,000 |
| (3) | 75,000 | = | 50,000 | + | 25,000 |
| (4) | 50,000 | = | 25,000 | + | 25,000 |

(19) ගනුදෙනුවකට අදාළ ද්විත්ව සටහන පහත දැක් වේ.

ණය හිමි ගිණුම හර රු. 10,000

මුදල් ගිණුම බැර රු. 10,000

ඉහත ද්විත්ව සටහනට අදාළව සිදු වූ ගනුදෙනුව කුමක්දැයි තෝරන්න.

(1) රු. 10,000ක් වටිනා භාණ්ඩ ණයට ගැනීම.

(2) රු. 10,000ක් ණය හිමියකුට ගෙවීම.

(3) රු. 10,000ක භාණ්ඩ අත්පිට මුදලට ගැනීම.

(4) රු. 10,000ක බැංකු ණය ගෙවීම.

(20) හෂිනි විසින් රන්මිනිට දෙන ලද විකුණුම් ඉන්වොයිසියක් 10% 30 ශුද්ධ 90 ලෙස සඳහන් වී තිබුණි. එහි අදහස වන්නේ,

(1) 10%ක වෙළඳ වට්ටමක් යටතේ දින 30ත් දින 90ත් අතර කාලයක් තුළ ණය මුදලේ ශුද්ධ වටිනාකම ගෙවිය යුතු බව ය.

(2) ණය මුදලේ ශුද්ධ වටිනාකම දින 30 කින් ගෙවිය යුතු අතර, ණය ගෙවීමට දෙන කාල සීමාව දින 30ක් බව ය.

(3) ණය මුදලේ ශුද්ධ වටිනාකම ගෙවීමට දින 90ක කාලයක් ලබාදෙන අතර, දින 10කට කලින් ණය පියවුවහොත් රු. 30/=ක වට්ටමක් ලබාදෙන බව ය.

(4) ණය මුදලේ ශුද්ධ වටිනාකම ගෙවීමට ලබාදෙන කාලය දින 90ක් වන අතර, දින 30කට පෙර ණය පියවන්නේ නම් තවත් 10%ක වට්ටමක් ලබාදෙන බව ය.

(21) වියදම් ගිණුම් පමණක් දක්වෙන පිළිතුර තෝරන්න.

(1) වැටුප් ගිණුම, ලද ගෙවල් කුලී ගිණුම, දුන් වට්ටම් ගිණුම
(2) රක්ෂණ ගාස්තු ගිණුම, ගැනිලි ගිණුම, දුන් කොමිස් ගිණුම
(3) ගැනිලි ගිණුම, පොලී ගිණුම, ගෙවල් කුලී ආදායම් ගිණුම
(4) දුරකථන බිල් ගිණුම, වැටුප් ගිණුම, දුන් කොමිස් ගිණුම

(22) වාහන අලෙවිකරණ ව්‍යාපාරයක වාහන ණයට ගැනීම සටහන් කරන මූලික පොත වන්නේ.

(1) මුදල් පොත ය.. (2) ගැනුම් ජ'නලය ය.
(3) විකුණුම් ජ'නලය ය. (4) පොදු ජ'නලය ය.

- පහත සඳහන් තොරතුරු ඇසුරෙන් (23) හා (24) ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

2017 ජනවාරි 31 දිනට චමුදි ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය රු. 16,000 කි.
පහත සඳහන් හේතු නිසා බැංකු ප්‍රකාශනයේ ශේෂය මෙම අගයට වඩා වෙනස් විය.

A - තැන්පත් කළත් නිෂ්කාශනය නොවූ චෙක්පත්වල වටිනාකම රු. 5000/=කි.
B - නිකුත් කළත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් රු. 3000/= කි.
C - බැංකු ගාස්තු රු. 500/= කි.
D - ලාභාංශ ප්‍රේෂණ රු. 8000/= කි.

(23) ඉහත ප්‍රකාශන අතරින් බැංකු ගිණුමේ ශේෂය, බැංකු ප්‍රකාශනයේ ශේෂයට වඩා අඩුවීමට බලපාන හේතු වන්නේ,

(1) B හා D පමණි. (2) A හා B පමණි. (3) B හා C පමණි. (4) C හා D පමණි.

(24) 2017 ජනවාරි 31 දිනට සංශෝධිත බැංකු ගිණුමේ ශේෂය කීය ද?

(1) රු. 21,500/= (2) රු. 23,500/= (3) රු. 24,000/= (4) රු. 26,500/=

(25) ඉෂිනිගේ ව්‍යාපාරයේ 2017 ජනවාරි 31 දිනට අත ඉතිරි සුළු මුදල් ශේෂය රු. 200/=කි. වියදම් කළ මුදල රු. 1800/=කි. පෙබරවාරි 28 වෙනි දින අත ඉතිරි මුදල රු. 300/= කි. මාර්තු 01 දිනට ප්‍රතිපූර්ණය කළ යුතු මුදල සොයන්න.

(1) රු. 200/= (2) රු. 300/= (3) රු. 1700/= (4) රු. 1800/=

(26) පහත දක්වෙන ගණුදෙනු සටහන් කරන මූලික පොත් පිළිවෙලින් දක්වෙන පිළිතුර තෝරන්න.

A - රු. 2000/= කට භාණ්ඩ රවිඳුගෙන් ගැනීම.
B - රු. 4000/= කට භාණ්ඩ තිනුරට විකිණීම.
C - රු. 20,000/=ක් වැටුප් ගෙවීම.
D - රු. 40,000/=කට ලී බඩු ණයට ගැනීම.

(1) ගැනුම් ජ'නලය, විකුණුම් ජ'නලය, මුදල් පොත, පොදු ජ'නලය
(2) මුදල් පොත, ගැනුම් ජ'නලය, විකුණුම් ජ'නලය, පොදු ජ'නලය
(3) ගැනුම් ජ'නලය, විකුණුම් ජ'නලය, පොදු ජ'නලය, මුදල් පොත
(4) පොදු ජ'නලය, මුදල් පොත, ගැනුම් ජ'නලය, විකුණුම් ජ'නලය

(27) ශේෂ පිරික්සුමේ හර හා බැර තීරුවල එකතුව සමාන වීමෙන් ඔබට කිවහැක්කේ;

(1) ගිණුම්කරණ ක්‍රියාවලිය ම නිවැරදි බව යි.

(2) ගිණුම්කරණ ක්‍රියාවලිය වැරදි බව යි.

(3) ගිණුම්කරණයේ අංක ගණිතමය නිවැරදිතාවයක් ඇති බව යි.

(4) ගිණුම්කරණ ක්‍රියාවලියේ අංක ගණිතමය වැරදීමක් ඇති බව යි.

- පහත සඳහන් තොරතුර ඇසුරෙන් (28) හා (29) ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

රු. 4000/= ක ණයට විකුණුම්, අදාළ ගිණුම් දෙකේ ම බැරට සටහන් වී ඇත.

(28) ඉහත සඳහන් වැරැද්ද නිසා ශේෂ පිරික්සුමට සිදු වූ බලපෑම වන්නේ,

(1) ශේෂ පිරික්සුමේ හරට රු. 4000ක් අඩු වීම ය.

(2) ශේෂ පිරික්සුමේ බැරට රු. 4000ක් අඩු වීම ය.

(3) ශේෂ පිරිස්සුමේ හරට රු. 8000ක් අඩු වීම ය.

(4) ශේෂ පිරික්සුමේ බැරට රු. 8000ක් අඩු වීම ය.

(29) ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ද්විත්ව සටහන වන්නේ,

(1) ණයගැති ගිණුම හර රු. 8000
අවිනිශ්චිත ගිණුම බැර රු. 8000

(2) අවිනිශ්චිත ගිණුම හර රු. 8000
ණයගැති ගිණුම බැර රු. 8000

(3) ණයගැති ගිණුම හර රු. 4000
අවිනිශ්චිත ගිණුම බැර රු. 4000

(4) අවිනිශ්චිත ගිණුම හර රු. 4000
ණයගැති ගිණුම බැර රු. 4000

- (30) හා (31) ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු සැලකිල්ලට ගන්න.

සුපිරි තරු ක්‍රීඩා සමජයේ 2017.01.01ට සාමාජික සංඛ්‍යාව 100කි. එක් අයෙකුගේ මාසික සාමාජික ගාස්තුව රු. 10කි. 2017.01.31 වන විට 10 දෙනකු සාමාජික මුදල් ගෙවා නැත.

(30) ලැබීම් හා ගෙවීම් ගිණුමට අදාළ සාමාජික මුදල වන්නේ,

(1) රු. 1000 (2) රු. 10,000

(3) රු. 10,800 (4) රු. 12,000

(31) ආදායම් ප්‍රකාශනයට අදාළ සාමාජික මුදල වන්නේ,

(1) රු. 1000 (2) රු. 10,000

(3) රු. 10,800 (4) රු. 12,000

- පහත සඳහන් තොරතුරු ඇසුරෙන් (32) හා (33) ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
පහත සඳහන් වන්නේ විනුක්ගේ ව්‍යාපාරයේ 2017 ජනවාරි මාසයට අදාළ තොරතුරු කිහිපයකි.

| | |
|---|---|
| සෘජු ද්‍රව්‍ය පිරිවැය | 70,000 |
| මුළු සෘජු පිරිවැය | 100,000 |
| වක්‍ර ද්‍රව්‍ය පිරිවැය | 10,000 |
| වක්‍ර ශ්‍රම පිරිවැය | 20,000 |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 50,000 |

ඉහත පිරිවැය මඟින් නිෂ්පාදනය කළ ඒකක ගණන 1000කි. ඒකක ලාභාන්තිකය 20%කි.

(32) මෙම ව්‍යාපාරයේ මුළු නිෂ්පාදන පිරිවැය වන්නේ,
(1) රු. 150,000 කි (2) රු. 160,000 කි. (3) රු. 180,000 කි. (4) රු. 250,000 කි.

(33) ඒකක ලාභාන්තිකය කීය ද?
(1) රු. 30 (2) රු. 32 (3) රු. 36 (4) රු. 50

(34) 2012.01.01 දින සෙතුමි ව්‍යාපාරය රු. 800,000ක් වටිනා වාහනයක් මිල දී ගත් අතර, සුන්බුන් අගය රු.100,000ක් විය. වාර්ෂික ක්ෂය වටිනාකම රු. 70,000 ක් නම්, එහි ඵලදායි අපේක්ෂිත ජීව කාලය කොපමණ ද?
(1) අවු. 07 (2) අවු. 08 (3) අවු. 09 (4) අවු. 10

(35) 2017.01.01 දින සචිනි ව්‍යාපාරයේ වාර්ෂික ගොඩනැගිලි කුලී වියදම රු. 120,000ත් වූ අතර, 20107.12.31 දින වන විට ගෙවා තිබූ ගොඩනැගිලි කුලිය රු. 100,000කි.
ඉහත ගණුදෙනුව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) 2017.01.31 දිනෙන් අවසන් වර්ෂයේ ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙන් දක්වෙන ගොඩනැගිලි කුලිය වන්නේ රු. 120,000යි.
(2) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස රු. 20,000ක් දක් වේ.
(3) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් ලෙස රු. 100,000ක් දක් වේ.
(4) ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙන් දක්වෙන ගොඩනැගිලි කුලිය රු. 100,000කි.

- පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන (36) සිට (40) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
මිරීල ව්‍යාපාරයේ 2017.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමෙන් උපුටාගත් තොරතුරු පහත දක් වේ.

| <u>වත්කම්</u> | රු. | <u>ආදායම්</u> | රු. |
|---|---|---|---|
| මුදල් ශේෂය | 12000 | විකුණුම් | 110,000 |
| බැංකු ශේෂය | 6000 | ලද වට්ටම් | 8000 |
| සුළු මුදල් ශේෂය | 200 | විවිධ ආදායම් | 3000 |
| ගොඩනැගිලි | 40,000 | | |
| තොගය(2017.01.01) | 8000 | <u>වියදම්</u> | රු. |
| ණයගැතියෝ | 24,000 | ගැනුම් | 60,000 |
| ලී බඩු | 30,000 | දුන් වට්ටම් | 4000 |
| මෝටර් රථ | 50,000 | වැටුප් හා වේතන | 11,000 |
| | | රක්ෂණ ගාස්තු | 2400 |
| <u>වගකීම්</u> | රු. | ප්‍රවාහන ගාස්තු | 3600 |
| බැංකු ණය | 30,000 | බැංකු ගාස්තු | 2800 |
| ණය හිමියෝ | 40,000 | ප්‍රචාරණ ගාස්තු | 6000 |
| | | බැංකු පොලී | 1000 |
| <u>හිමිකම</u> | රු. | | |
| ප්‍රාග්ධනය | 70,000 | | |

(36) මිරීල ව්‍යාපාරයේ 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය කීය ද?

(1) රු. 42,000 කි. (2) රු. 6000 කි. (3) රු. 68,000 කි. (4) රු. 110,000 කි.

(37) මිරීල ව්‍යාපාරයේ 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය කීය ද?

(1) රු. 68,000 කි. (2) රු. 53,000 කි. (3) රු. 42,000කි. (4) රු. 22,200 කි.

(38) මිරීල ව්‍යාපාරයේ 2017.12.31 දිනට අයිතිකරුගේ හිමිකම කීය ද?

(1) රු. 22,200 කි. (2) රු. 53,000 කි. (3) රු. 70,000කි. (4) රු. 92,200 කි.

(39) මිරීල ව්‍යාපාරයේ 2017.12.31 දිනට මුළු වත්කම් හා මුළු වගකීම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) රු. 159,000 හා රු. 30,000
(2) රු. 170,000 හා රු. 30,000
(3) රු. 170,000 හා රු. 70,000
(4) රු. 172,000 හා රු. 70,000

(40) මෙම ව්‍යාපාරයේ මූල්‍ය වියදම්වල එකතුව කීය ද?

(1) රු. 2800 කි. (2) රු. 3800 කි.
(3) රු. 5000කි. (4) රු. 7800කි.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

019

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

❖ පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(01) බිනුවර ජීවත්වන ප්‍රදේශයේ වැව ආසන්නයේ විශාල පන් යායක් ඇත. රජය විසින් පොලිතීන් බෑග් තහනම් කිරීමේ නීතිය පැනවීමෙන් පසු, "සුමුදු පන් බෑග්" නමින් අලංකාර නවීන පන්නයේ රටා සහිත පන් බෑග් නිපදවීමේ ව්‍යාපාරයක් 2017.01.01 දින බිනුවර ඇරඹීය. මේ සඳහා ඔහු ඉතිරි කරගත් රු. 200,000ක මුදල ද, රු. 20,000ක් වටිනා උපකරණ ද, යෙදූවේ ය. 2017.01.01 දින ම රු. 20,000ක් යොදා බැංකු ජංගම ගිණුමක් ඇරඹුවේ ය. පන් බෑග් නිෂ්පාදනයට සේවකයින් දෙදෙනෙකු බඳවා ගත්තේ ය. නියමිත පරිදි නිෂ්පාදන කටයුතු ඉටුවන්නේදැයි සොයා බලා එසේ නොවන අවස්ථාවල දී එම කටයුතු වෙනස් කිරීමට බිනුවර වග බලා ගත්තේ ය. 2017 ජනවාරි මස දරණ ලද වියදම් පහත සඳහන් පරිදි වේ.

| | රු. |
|---|---|
| ❖ පන් ඉදිරීමට සහ ගෙන ඒමට | 20,000 |
| ❖ බෑග් සාදන සේවකයන්ට වැටුප් | 30,000 |
| ❖ ඇසුරුම් සඳහා | 1800 |
| ❖ කම්හල් කුලී | 13,000 |
| ❖ විදුලි වියදම් (චෙක්පතකින්) | 3000 |
| ❖ ජල බිල (චෙක්පතකින්) | 2000 |

❖ උපකරණ වාර්ෂිකව 12% බැගින් ක්ෂය කරයි.

❖ මාසය තුළ නිෂ්පාදනය කළ බෑග් ගණන 1000කි. එක් බෑගයක් 20%ක ලාභාන්තිකයක් තබාගෙන, බෑග් සියල්ල ම විකුණන ලදී. විකුණුම් වෙනුවෙන් සියලු ආදායම් ලැබුණේ චෙක්පත් මඟිනි.

(i) (අ) 'සුමුදු පන් බෑග් ව්‍යාපාරය' අරමුණ අනුව හා අයිතිය අනුව කුමන ව්‍යාපාර වර්ගයන්ට අදාළ වේ දැයි වෙන වෙනම ලියන්න.

(ආ) සංවිධාන ක්‍රමය අනුව කුමන ව්‍යාපාර වර්ගයකට අයත්වේ ද?

(ii) (අ) මෙම ව්‍යාපාරය සම්බන්ධව ඇති ව්‍යාපාරික අවස්ථාවක් ඉදිරිපත් කරන්න.

(ආ) 'මෙම ව්‍යාපායේ නම ලියාපදිංචි කළ යුතු ද? ඔබේ පිළිතුරට හේතු ඉදිරිපත් කරන්න.

(iii) (අ) කළමනාකරණ කාර්යයන් අතුරින් පාලනයට අදාළ සිද්ධියක් ඡේදය ඇසුරින් ඉදිරිපත් කරන්න.

(ආ) සිද්ධියේ සඳහන් මෙම ව්‍යාපාරයට ඇල්මැති පාර්ශ්වයන් දෙකක් නම් කරන්න.

(iv) (අ) ඉහත සිද්ධියේ සඳහන් නිෂ්පාදන සාධක දෙකක් නම් කරන්න.

(ආ) එම නිෂ්පාදන සාධක සඳහා නිදසුන බැගින් ඉදිරිපත් කරන්න.

(v) (අ) 2017.01.01 දිනට මෙම ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය අගයයන් සහිතව ලියා දක්වන්න.

(vi) මෙම ව්‍යාපාරය පවත්වාගෙන යා යුතු මූලික පොත් නම් කරන්න.

(vii) මෙම ව්‍යාපාරයේ 2017 ජනවාරි මාසය තුළ මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.

(vii) පන් බෑගයක විකුණුම් මිල කීය ද?

(ix) 2017.01.31 දිනට මුදල් ශේෂය කීය ද?

(x) 2017 ජනවාරි 31 දිනට අයිතිකරුගේ හිමිකම කොපමණ ද?

(ලකුණු 2 × 10 = 20)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

❖ ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

(02) (i) (අ) මිනිස් අවශ්‍යතාවයක් යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ආ) ලාභ අරමුණු කරගත් ව්‍යාපාරවල පොදුවේ දැකිය හැකි අරමුණු දෙකක් ලියන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද, යන්න දක්වන්න.

(අ) පුද්ගලයින් තමා සතු අතිරික්ත භාණ්ඩ, අනෙකුත් පුද්ගලයන් සමග හුවමාරු කර ගනිමින් තමන්ට අවශ්‍ය අනෙකුත් භාණ්ඩ ලබාගැනීම හෙවත් භාණ්ඩයකට භාණ්ඩයක් හුවමාරු කර ගැනීම 'බාටර් ක්‍රමය' ලෙස හැඳින් වේ.

(ආ) මිනිස් වුවමනා සීමිත වන අතර, අවශ්‍යතා අසීමිත වේ.

(ඉ) පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා පාරිභෝගිකයන් වෙත ලබාදෙන ක්‍රියාවක් හෝ ක්‍රියාවලියක් සේවා නිෂ්පාදනය ලෙස හැඳින් වේ.

(ඊ) නිෂ්පාදන සාධක ලෙස, ව්‍යාපාරය සඳහා යොදන කායික හා මානසික දායකත්වය ව්‍යවසායකත්වය ලෙස හැඳින් වේ.

(iii) පරිගණක තාක්ෂණය, සන්නිවේදන තාක්ෂණය, ඩිජිටල් තාක්ෂණය හේතුවෙන් ඇති වූ නිෂ්පාදන ක්‍රමවල දියුණුවත්, ප්‍රවාහන තාක්ෂණයේ දියුණුවත් තාක්ෂණික පරිසරයට අයත් ය.

(අ) ව්‍යාපාර පරිසරය යනු කුමක් ද?

(ආ) තාක්ෂණික පරිසරයේ වෙනස්වීම නිසා ව්‍යාපාරවල සිදු වූ වෙනස්කම් සඳහා නිදසුන් දෙකක් ලියන්න.

(iv) ව්‍යාපාර සංවිධාන අරමුණ අනුව, අයිතිය අනුව හා පරිමාණය අනුව වර්ගීකරණය කෙරේ.

(අ) පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී භාවිත කරන ප්‍රමාණාත්මක නිර්ණායක හතරක් ලියන්න.

(ආ) ඒක පුද්ගල ව්‍යාපාර හා හවුල් ව්‍යාපාරවල දැකිය හැකි සමාන ලක්ෂණ දෙකක් ලියන්න.

(ලකුණු 2 × 4 = 8 )

(03) (i) (අ) ලංකා බැංකුව සහ මහජන බැංකුව නිකුත් කර ඇති ණය කාඩ්පත් නම් කරන්න.

(ආ) ඉතුරුම් තැන්පත් හා ස්ථාවර තැන්පත් අතර වෙනස්කම් දෙකක් ලියන්න.

(ii) (අ) ජංගම ගිණුමක් පවත්වාගෙන යාමෙන් ලැබෙන වාසි හතරක් සඳහන් කරන්න.

(ආ) බැංකු ගිණුම් ප්‍රකාශය යනු කුමක් ද?

(iii) (අ) දේපල රක්ෂණය හා ජීවිත රක්ෂණය අතර ඇති වෙනස්කම් දෙකක් ලියන්න.

(ආ) ප්‍රවාහන මූලිකාංග හතර ලියා දක්වන්න.

(iv) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) 'පිරිවැය' යනු සන්නිවේදන මූලිකාංගයකි.

(ආ) වේගවත් බව ගුවන් ප්‍රවාහනයේ වාසියක් වන අතර, පිරිවැය අධික වීම එහි අවාසියකි.

(ඉ) ශ්‍රී ලංකාව රෙදි ආනයනය කරන අතර, නිමි ඇඳුම් අපනයනය කරයි.

(ඊ) දේපළ හෝ ජීවිත රක්ෂණය කළ විට ඒවායේ ඇති අවදානම නැති වේ.

(ලකුණු 2 × 4 = 8)

(04) (i) (අ) ආයෝජනය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ආ) ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.

(ii) (අ) සාමාන්‍ය කොටස්වල ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.

(ආ) කළමනාකරණය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(iii) නිෂ්පාදිත, පාරිභෝගිකයා වෙත ලබා දීමට නිෂ්පාදකයෙකුට භාවිත කළ හැකි විවිධ මාර්ග ඇත. ඒ සඳහා නිදසුන් දෙකක් ලියන්න.

(iv) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) පාසලේ වාණිජ දිනය පැවැත්වීම සඳහා කළයුතු කාර්යයන් තීරණය කිරීම හා අවශ්‍ය මුදල් හා සම්පත් ලබාගන්නා අකාරය තීරණය කිරීම, සංවිධානයට අයත් කාර්යයකි.

(ආ) මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා වටිනාකමින් යුත් නිෂ්පාදිතයක් නිර්මාණය කිරීමේ හා පිළිගැන්වීමේ ක්‍රියාවලිය අලෙවිකරණයයි.

(ඉ) ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේ දී සලකා බලන සාධක වන අවදානම හා ප්‍රතිලාභය අතර ඇත්තේ ප්‍රතිලෝම සම්බන්ධතාවයකි.

(ඊ) කොටස් වෙළඳපොල ගණුදෙනු මෙහෙයවනු ලබන්නේ කොළඹ කොටස් හුවමාරුව මඟිනි.

(ලකුණු 2 × 4 = 8)

## <u>II කොටස - ගිණුම්කරණය</u>

(05) (i) (අ) ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ කුමක් ද?

(ආ) ගණුදෙනුවක් යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

(ii) (අ) පොදු ජ'නලය අනෙකුත් මූලික පොත්වලින් වෙනස්වන ලක්‍ෂණ දෙකක් ලියන්න.

(ආ) රු. 50,000කට ලී බඩු ණයට ගැනීම ජ'නල් ගත කරන්න. (ලකුණු 02)

(ii) (අ) පහත සඳහන් වන්නේ සේමිනිගේ ව්‍යාපාරයේ 2017 ජනවාරි මාසයේ ගණුදෙනු ය. වත්කම් = හිමිකම් + වගකීම් යන ගිණුම්කරණ සමීකරණයට පහත සඳහන් ගණුදෙනු ආදේශ කරන්න.

- 2017.01.01 සේමිනි, ව්‍යාපාරයට රු. 100,000ක් යෙදීම.
- 2017.01.08 රු. 20,000ක් වටිනා උපකරණ ණයට ගැනීම
- 2017.01.13 රු. 20,000ක භාණ්ඩ රු. 30,000කට ණයට විකිණීම.
- 2017.01.16 රු. 30,000ක් ණයහිමියන්ට ගෙවීම.
- 2017.01.20 රු 12,000ක් ණයගැතියන්ගෙන් ලැබීම. (ලකුණු 02)

(ආ) පහත සඳහන් වන්නේ අසංගිකා ව්‍යාපාරයේ 2017 ජනවාරි මස ගණුදෙනු කිහිපයක් ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරයයි.

| දිනය | වත්කම් | | | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|---|---|
| | ණයගැතියෝ | තොගය | යන්ත්‍ර | මුදල් | ප්‍රාග්ධනය | බැංකු ණය | ණයහිමි |
| 2017.01.05 | | | + 200,000 | | + 200,000 | | |
| 2017.01.12 | | + 50,000 | | - 20,000 | | | + 30,000 |
| 2017.01.18 | + 30,000 | - 20,000 | | | + 10,000 | | |
| 2017.01.25 | | | | - 20,000 | - 20,000 | | |

- මෙම මාසය තුළ ගැනිලි කිසිවක් සිදුකර නැත.

මෙම ව්‍යාපාරයේ ඒ ඒ දිනයේ සිදුවිය හැකි යැයි උපකල්පනය කරන ගණුදෙනු වටිනාකම් සහිතව දක්වන්න. (ලකුණු 02)

(iv) (අ) පහත සඳහන් වන්නේ බූත්මල් ව්‍යාපාරයේ සිදු වූ ගණුදෙනු කිහිපයකි. ඒ ඇසුරින් වට්ටම් තීරු සහිත මුදල් පොත පිළියෙල කරන්න.

2017.01.01 මුදල් ශේෂය රු. 70,000/= කි.

2017.01.11 ශලනිගෙන් රු. 13,500ක් මුදල් ලැබුණි. අඩුකළ වට්ටම් රු. 1500කි.

2017.01.18 රුහිනිට ගෙවිය යුතු රු. 10,000ක ණය මුදල ගෙවීමේ දී 10%ක වට්ටමක් ලැබුණි.

2017.01.25 චමල්ගෙන් රු. 20,000ක ණය මුදල ලැබීමේ දී 10%ක වට්ටමක් දෙන ලදී. (ලකුණු 02)

(ආ) ඉහත සඳහන් ගනුදෙනු ඇසුරින් පිළියෙල කළ මුදල් පොත ලෙජරයට පිටපත් කරන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 12)

(06) (i) (අ) ව්‍යාපාර ගණුදෙනු තුළින් බිහිවන ආදායම් ලෙස හැඳින්වෙන්නේ මොනවා ද?

(ආ) හිමිකමක් වැඩි වී වගකීමක් අඩුවන ගණුදෙනුවක් ලියන්න. (ලකුණු 02)

(ii) කොහුබත් යොදා මල් පෝච්චි නිෂ්පාදනය කරන ජානියගේ ව්‍යාපාරයේ 2017 ජනවාරි මාසයට අදාළ තොරතුරු කීහිපයක් පහත දක් වේ.

එක් මල් පෝච්චියක් නිෂ්පාදනයට යෙදු කොහුබත් සඳහා වියදම රු. 60/=කි.

එක් මල් පෝච්චියක් නිෂ්පාදනයට නිෂ්පාදකයාට ගෙවන වැටුප රු. 40/=කි.

ජනවාරි මාසය තුළ නිෂ්පාදනය සඳහා දරූ අනෙකුත් වියදම්,

| | |
|---|---|
| අමතර ද්‍රව්‍ය සඳහා | රු. 14,000/= |
| සුපරීක්ෂක වේතන | රු. 10,000/= |
| ජල බිල | රු. 3000/= |
| විදුලි බිල | රු. 2000/= |
| උපකරණ ක්ෂය | රු. 1000/= |

ජනවාරි මාසය තුළ නිෂ්පාදනය කළ මල් පෝච්චි ගණන 1000කි. පිරිවැය මත ලාභ ප්‍රතිශතය 20%කි.

(අ) එක් මල් පෝච්චියක නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.

(ආ) එක් මල් පෝච්චියක විකුණුම් මිල ගණනය කරන්න. (ලකුණු 02)

(iii) චතුමී ව්‍යාපාරයේ 2017 ජනවාරි මාසයේ 31 දිනට බැංකු ගිණුමේ ශේෂය රු. 20,000කි. නමුත් එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය ඊට වෙනස් ය. වෙනසට හේතු පහත දක් වේ.

- තැන්පත් කළත් උපලබ්ධි නොවූ චෙක්වල වටිනාකම රු. 5,000කි.
- නිකුත් කළත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්වල වටිනාකම රු. 8,000කි.
- ණයගැතියකු සෘජුවම බැංකුවේ තැන්පත් කර ඇති මුදල රු. 10,000කි.
- බැංකුව අය කළ බැංකු ගාස්තු රු. 500කි.
- නිත්‍ය නියෝග මත ගෙවීම රු. 2500කි. (රක්ෂණ ගාස්තු)

(අ) 2017 ජනවාරි 31 දිනට බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය සොයන්න.

(ආ) බැංකු සැසඳුම පිළියෙල කරන්න. (ලකුණු 04)

(iv) මිතාරා ව්‍යාපාරයේ 2017 දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ බැර තීරුව රු. 11,000ක් අඩු වී ඇති බැවින්, එය අවිනිශ්චිත ගිණුමේ බැරට සටහන් කරන ලදී. පසුව පහත සඳහන් වැරදි අනාවරණය විය.

(1) ලී බඩු මිල දී ගැනීමට වැයකළ රු. 20,000/= ලී බඩු අලුත්වැඩියා ගිණුමට හර කර ඇත.

(2) රු. 10,700 ක් වූ විවිධ වියදම් ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමට ගෙනගොස් ඇත්තේ රු. 10,000ක් ලෙස ය.

(3) රු. 3500ක ණයට විකුණුම් රු. 5300ක් ලෙස ණයගැති ගිණුමේ සටහන් කිරීම.

<u>පිළියෙල කළ යුත්තේ,</u>

(අ) වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන්

(ආ) වැරදි නිවැරදි කිරීමෙන් පසු අවිනිශ්චිත ගිණුම (ලකුණු 04)

(මුළු ලකුණු 12)

(07) (i) (අ) ද්විත්ව සටහන් ක්‍රමය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ආ) ලෙජරයේ ඇති ගිණුම් වර්ග කීය ද? ඒ මොනවා ද? (ලකුණු 02)

(ii) රන්තරු ක්‍රීඩා සාමාජයේ සාමාජික සංඛ්‍යාව 150ක් වන අතර, එක් සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 200/=කි. 2017 වර්ෂයේ ලැබීම් හා ගෙවීම්වලට අදාළ තොරතුරු කිහිපයක් පහත දක් වේ.

| | රු. |
|---|---|
| සාමාජික මුදල් | 28,000 |
| ක්‍රීඩා උපකරණ මිලට ගැනුම් | 10,000 |
| ක්‍රීඩා පිටිය පාලක වේතන | 12,000 |
| පරිත්‍යාග ලැබීම් | 5000 |
| විදුලි ගාස්තු | 6000 |
| සංග්‍රහ වියදම් | 4000 |
| ජල ගාස්තු | 3000 |

- ගෙවිය යුතු සංග්‍රහ වියදම් රු. 2000කි.
- ක්‍රීඩා උපකරණ වාර්ෂිකව 10% බැගින් ක්ෂය කරනු ලැබේ.

<u>අවශ්‍ය වන්නේ,</u>

රන්තරු ක්‍රීඩා සමාජයේ 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීමයි. (ලකුණු 02)

(iii) හෙමේෂා ව්‍යාපාරයේ 2017.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක් වේ.

ශේෂ පිරික්සුම

| විස්තරය | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| තොගය (2017.01.01 දිනට) | 7000 | |
| ගැනුම් | 120,000 | |
| විකුණුම් | | 250,000 |
| ණය ගැතියෝ | 20,000 | |
| ණය හිමියෝ | | 10,000 |
| ගෙන ඒමේ කුලී | 3000 | |
| 10% බැංකු ණය | | 50,000 |
| ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැයට) | 300,000 | |
| රථවාහන (පිරිවැයට) | 150,000 | |
| බැංකු ණය පොලිය | 2000 | |
| දුන් වට්ටම් | 1000 | |
| ලද වට්ටම් | | 2000 |
| ගෙවල් කුලී හා වරිපනම් | 4000 | |
| රක්ෂණය | 3000 | |
| බොල් ණය | 2000 | |
| රථ වාහන ක්ෂය වෙන්කිරීම් | | 10,000 |
| ප්‍රාග්ධනය | | 290,000 |
| | 612,000 | 612,000 |

අමතර තොරතුරු පහත දැක් වේ.

- 2017.12.31 දිනට භාණ්ඩ තොගය රු. 10,000කි.
- රථවාහන වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කරන්න.
- ණය ගැතියන්ගෙන් 10% ක් බොල් ණය ලෙස කපා හරින්න.

අවශ්‍ය වන්නේ,

(අ) 2017.12.31 දිනෙන් අවසන් වසර සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ලකුණු 04)

(ආ) 2017.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 04)

(මුළු ලකුණු 12)